26 - 2 - 1996

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1995 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින.]

එල්. ඩී.—ඕ. 37/95

**තොග සහ සිල්ලර විකිණීම් සම්බන්ධයෙන් පළාත් සභා විසින් පිරිවැටුම් බදු පැනවිය හැක්කේ යම් සීමා ඇතුළත ද සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව ද ඒ සීමා හා නිදහස් කිරීම් නියම කිරීම සඳහා වූ පනතකි.**

පාර්ලිමේන්තුව විසින් පනවනු ලද නීතියෙන් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, තොග සහ සිල්ලර විකිණීම් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු පනවමින් ප්‍රඥප්ති සෑදීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභාවලට බලය පවරා දෙනු ලැබ ඇති හෙයින් ද: **පූර්විකාව.**

පළාත් සභාවලට එම බලය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබාදීමේ අරමුණ ඇතිව, ඒ සීමා සහ නිදහස් කිරීම් පාර්ලිමේන්තුව විසින් නියම කිරීම අවස්ථාවෝචිත වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1995 අංක 25 දරන පළාත් සභා පිරිවැටුම් බදු (සීමා හා නිදහස් කිරීම්) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **සංක්ෂිප්ත නාමය.**

2. (1) තොග සහ සිල්ලර විකිණීම් සම්බන්ධයෙන්, පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්තියක් මගින් පනවනු ලබන පිරිවැටුම් බද්දක්, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ දැක්වෙන සීමා ඇතුළත ද, මේ පනතේ උපලේඛනය සමඟ කියවිය යුතු, මේ වගන්තියේ (3) වන උපවගන්තියේ දැක්වෙන නිදහස් කිරීම්වලට යටත්ව ද, විය යුතු ය. **පළාත් සභා විසින් පනවනු ලබන පිරිවැටුම් බදු සම්බන්ධයෙන් සීමා සහ එම බදුවලින් නිදහස් කිරීම.**

(2) ඒ පිරිවැටුම් බද්ද අය කරනු ලැබිය හැකි අනුප්‍රමාණය, කිසිම අවස්ථාවක දී ඒ බද්ද අය කෙරෙන පිරිවැටුමෙන් සියයට පහක් නොඉක්මවිය යුතු ය.

(3) මේ පනතේ උපලේඛනයේ දැක්වෙන තොග සහ සිල්ලර විකිණීම්වලින් ලැබෙන පිරිවැටුම, ඒ පිරිවැටුම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. **අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි "භාණ්ඩය" සහ "නිෂ්පාදකයා" යන යෙදුම්වලට, 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි ඒ යෙදුම් සඳහා දී ඇති අර්ථම ඇත්තේ ය. **අර්ථ නිරූපණය.**

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදයෙන් පිහිටුවා ඇති පළාත් සභාවක් අදහස් වේ.

2—ඊ046750—7.705 (95/09)

## I වන උපලේඛනය

[(2) (1) වගන්තිය]

**නිෂ්පාදකයකු විසින්, ඔහු නිෂ්පාදනය කළ භාණ්ඩ කිසිවක් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම.**

**ශ්‍රී ලංකාවෙන් පිටත ගැණුම්කරුවන්ට භාණ්ඩ කිසිවක් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම.**

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් විසින් තොග වශයෙන් සහ සිල්ලරට විකිණීම.**